# බ/නමුණුකුල ළමා මිතුරු පාසල, නමුණුකුල

## B/Namunukula Child Friendly School, Namunukula

දු. අංක: 055 5752117
T.P.


දිනය:..............................

අධ්‍යක්ෂ තුමා,

EDEX ව්‍යාපෘතිය,

රාජකීය මාවත,

කොළඹ 07.

RECEIVED 27 MAR 2014

ගුරු මහත්මයාණෙනි,

**<u>තුති පුද කිරීමයි</u>**

ඔබ සංවිධානය විසින් අප වෙත ලබා දුන් පරිගණකය, පුස්තකාල පොත් හා ළමුන්ට ත්‍යාග වශයෙන් ලබාදුන් අභ්‍යාස පොත් තුති සිතින් යුතුව භාරගත්තෙමු. ඔබ සංවිධානයේ අධ්‍යක්ෂ තුමා, නිළධාරි මණ්ඩලය ඇතුළු සියලුම සාමාජිකයන්ට අප හද පිරි තුති පුද කරමු.

දුරු කතර ගෙවා ගෙන අප දුප්පත් විදු පියසට පැමිණ ලබාදුන් මෙම ත්‍යාගයන් අපහට ඉතා අගනා බව සඳහන් කල යුතුය. ඔබගේ තේමාවට අනුව සැබවින්ම මෙය අපට සිහිනයට ජීවයකි. ලාංකේය යෞවනය ගෝලීය වශයෙන් තරගකාරි කිරීමට ඔබ දරන ප්‍රයත්නයට අපි ආශිර්වාද කරන්නෙමු.

ඒ සඳහා ඔබ සැමට ශක්තිය හා ධෛර්යය ලැබේවා.

මෙයට,

විදුහල්පති ස්වාමින් වහන්සේ, ආචාර්ය මණ්ඩලය,

දෙමව්පියන් හා දරු දැරියන්

විදුහල්පති
උඩුවර පඤ්ඤාකිත්ති ස්ථවිර
බ/නමුණුකුල විද්‍යාලය
(ළමා මිතුරු පාසල)
නමුණුකුල